**උපදෙස් පත්‍රිකාව**

මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් සිදු කරන බැවින් ඒ සඳහා පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

**පියවර (01)**

අයදුම්පත් ගාස්තු ගෙවීම

ඔබ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත සම්පූර්ණ කිරීමට ප්‍රථමයෙන් ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු වශයෙන් රුපියල් (1000/-) ක් ගෙවීම අනිවාර්ය වේ. (මහජන බැංකුව, ගංගොඩවිල ශාඛාවට බැර වන පරිදි ඔනෑම මහජන බැංකුව ශාඛාවකින් මෙම මුදල් තැන්පත් කිරීම සිදු කළ හැකිය.)

| පාඨමාලාව | ගිණුම් අංකය |
|---|---|
| අපරාධවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව (Intake 16) | 013010001322 |

- මුදල් තැන්පතු රිසිට් පතේ පාඨමාලාවට අයදුම්කරන්නාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා දුරකතන අංකය ඇතුලත් කිරීමට කටයුතු කරන්න.
- බැංකු රිසිට් පතෙහි ඡායාපිටපතක් ඔබ ළග තබා ගැනීම අනිවාර්ය වේ.
- ඔබ විසින් ගෙවන ලද අයදුම්පත් ගාස්තුව කිසිම හේතුවක් මත නැවත නොගෙවන බව ද දන්වා සිටිමු.

| |
|---|
| පාඨමාලා ගාස්තුව ඔබට වාරික දෙකකින් ගෙවිය හැකිය. පළමු වාරිකය (රුපියල් 50000 ක්) පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේ දී ගෙවිය යුතු අතර දෙවන වාරිකය (රුපියල් 25000) පාඨමාලාව ආරම්භ වී මාස තුනක් ඇතුළත ගෙවීම් සිදු කළ යුතුය. (පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා එක් එක් සිසුන්ට අනන්‍ය වූ බැංකු ගිණුම් අංක පවතින අතර අදාල ගිණුම් අංක පාඨමාලාව සඳහා තෝරා ගැනීමෙන් පසු ඔබට ලබාදෙනු ඇත) |

**පියවර (02)**

ඩිප්ලෝමා පාඨමාලාවට අදාල ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තු ගෙවීමෙන් අනතුරුව පහත ලින්ක් එකට පිවිස පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ අයදුම් පත්‍රය සම්පූර්ණ කරන්න.

https($$docs'google'com$forms$d$e$1FAIpQLScfukXNlhsrP8RMK0R9Pw6FAZmnZZQhPa0NV50MCB6R9x6UtA$viewform@usp}sf_link

**පියවර (03)**

ලබාදී ඇති මාර්ගගත අයදුම්පත්‍රය අයදුම්කරුට එක් වරක් පමණක් පිරවිය හැකි බැවින් එය ඉතාමත් සැලකිලිමත්ව පිරවීමට වගබලා ගන්න. ඔබගේ නිවැරදි තොරතුරු පමණක් ලබා දී ඇති ගූගල් ෆෝරමයේ නිවැරදි ස්ථානයේ නියමිත පරිදි සම්පූර්ණ කරන්න.

Diploma in Criminology

එසේම ඔබගේ පෞද්ගලික ලිපිගොනුව තුළ අඩංගු විය යුතු පහත සඳහන් ලේඛනවල මුල් පිටපත් වල (Original certificates) පී.ඩී.එෆ් (PDF) පමණක් උඩුගත (Upload) කළ යුතුය. (පහත ලිපිගොනු උඩුගත කිරීමට ප්‍රථමයෙන් එම ලිපිගොනු ඔබගේ නමින් (Rename) කරන්න.

i. ජාතික හැඳුනුම්පත් පිටපත (මුලකුරු සමඟ නම M L Perera)
ii. උප්පැන්න සහතිකය
iii. අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) අධ්‍යාපන සහතික පිටපත්
iv. වෙනත් අධ්‍යාපන සුදුසුකම් සහතික සහතික පිටපත්
v. සේවා සහතිකය
vi. අයදුම්පත් ගාස්තු ගෙවන ලද රිසිට් පතෙහි පිටපත.

**පියවර (04)**

අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ විද්‍යුත් තැපැල වෙත අප විසින් එවන ලද ඔබගේ අයදුම්පත්‍රයේ පිටපතෙහි දෘඩ පිටපතක් (Printout) ලබා ගන්න

**පියවර (05)**

ලබාගත් අයදුම්පත, මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ උඩුගත කරන ලද ලේඛනවල සහතික කල පිටපත් (True Copy) සමඟ අමුණා පහත ලිපිනයට (2026/06/10) දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල ඔස්සේ එවිය යුතුය. (සැ.යු ඔබගේ සහතිකවල මුල් පිටපත් එවීම අවශ්‍යය නොවේ.)

**පාඨමාලා සමායෝජක,**
**අපරාධවිද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය,**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**ගංගොඩවිල,**
**නුගේගොඩ.**

සැ.යු. - ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර **"අපරාධ විද්‍යාව ඩිප්ලෝමා පාඨමාලාව (2026/2027)"** ලෙස සඳහන් කරන්න.

පොදු උපදෙස්

- මෙම උපදෙස් මාලාවට අනුකූල නොවන ලෙස එවන අයදුම්පත් සහ 2026/06/10 දිනට පසු ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- ඔබගේ අයදුම් පත්‍රය අනුව අදාල පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණයට ඔබව තෝරාගනු ලැබුවහොත් ඒ බව පෞද්ගලිකව දන්වනු ලබන අතර පාඨමාලා ගාස්තු ගෙවිය යුත්තේ ඒ අනුවය.
- පාඨමාලා ගාස්තු තම සේවායෝජකයා මගින් ගෙවීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් තම අයදුම්පත් තම සේවායෝජකයා මගින් එවීම් ප්‍රමාණවත් වනු ඇත.

**********************************



Diploma in Criminology